

# ඕස්ට්‍රේලියාවේ ගුවන් යානයක් පැහැර ගැනීමට උත්සාහ කළ ලාංකික මානසික රෝගියා හඳුනා ගැනීම දක්වා සමාජ පරිණාමය

**අජිත් පැරකුම් ජයසිංහ**



ඕස්ට්‍රේලියාවෙන් පිටත් වූ මැලේසියන් ගුවන් සේවයට අයත් යානයක් පැහැර ගැනීමට උත්සාහ දැරීම සම්බන්ධයෙන් මානසික රෝගියකු යයි සැක කරනු ලබන ශ්‍රී ලාංකිකයකු අත්අඩංගුවට ගෙන තිබේ.

මේ මානසික රෝගියා මානසික රෝගියකු ලෙස සැලකීමට ලංකාවේ සමාජයට හැකි වීම එක්තරා දුරකට අප අත්පත් කරගෙන තිබෙන සමාජ සංවර්ධනයකැයි සැලකිය හැකි ය.

අදින් අවුරුදු 35කට පෙර 1982 ජූනි මාසේ 30 සිදු වූ සිද්ධියක් සිහිපත් වේ. අතිශය පෞද්ගලික අරමුණක් වෙනුවෙන් ගුවන් යානයක් පැහැරගෙන රටේ කීර්ති නාමයට බරපතල කැළැලක් සිදු කළ මෙවැනි ම උන්මත්තකයකු එකල ලංකාවට වීරයකු විය.

දැනුත් පත්තරකාරයෝ අවුරුද්දකට හමාරකට වරක් මේ පුද්ගලයාගේ සම්මුඛ සාකච්ඡා ආදිය පළ කර ඔහු ඔසවා තබති. උන්මත්තකයා පුනරුත්ථාපනය නො කර, එම පුද්ගලයාගේ උම්මත්තකභාවය වීරත්වයට නැගීම සමාජ විරෝධී ක්‍රියාවකි.

මේ කාඩ්බෝඩ් වීරයා සම්බන්ධයෙන් මතු වන චෝදනාවක් වන්නේ ගුවන් යානා පැහැර ගැනීම සම්බන්ධයෙන් සිරගත වී සිටි ඔහු 1983 ජූලි මාසයේදී දෙමළ සිරකරුවන් 53ක් පහර දී, කපා කොටා මරා දැමීමේ ප්‍රහාරයට නායකත්වය දුන් බවයි. එහෙම නායකත්වය දීමේ හැකියාවක් ඔහුට ලැබෙන්නට ඇත්තේ මාධ්‍ය විසින් කරන ලද පිම්බීම නිසා ය.

මෙම ඝාතනයට එවකට වැලිකඩ බන්ධනාගාරයේ සිටි ප්‍රධානීන්ගේ අනුග්‍රහය ලැබී තිබිණි. එම සිදුවීම මෙහෙයවූ බව කියමින් වීර සිංහලයකු හා ඉතා සැර පරුෂ පුද්ගලයකු ලෙස හැසිරුණු ප්‍රධාන ජේලර්වරයකු වසර කීපයකට පසු මම මැගසින් බන්ධනාගාරයේදී දුටුවෙමි. මෙම සමූහ ඝාතනය ගැන කිසි කලෙක නිසි විමර්ශනයක් සිදු වූයේ නැත.

මෙවැනි අපරාධකරුවන් දැනුත් මතු වේ. සියලු අපරාධකරුවන්ගේ ද අවසාන නවාතැන ජාතිවාදය හා ආගම්වාදය වීම කෙතරම්

**අපරාධකරුවන්, උම්මත්තකයන්, මෝඩයන් වැනි අය ක්‍රම විරෝධී වීරයන් ලෙස සැලකීමේ ප්‍රවණතාවක් ඇත අතීතයේ සිට ම ලංකාවේ තිබේ.**

උත්ප්‍රාසජනක ද? අලුත් ම උදාහරණය එස්. එෆ්. ලොක්කා නමින් ප්‍රසිද්ධ වූ, සමූහයක් සමග එක්ව අනුරාධපුරයේ නයිට් ක්ලබ් හිමිකරුවකු වූ වසන්ත සොයිසා නමැත්තා නිරායුධව සිටියදී මරා දැමූ ඝාතකයා ය.

8 වන පිටට

සන්නස

**Sannasa**
244 Princes Hwy
Hallam VIC 3803 Australia

email -
sannasanews@gmail.com
Tel 0432 391 922/ 0433 438 535
www.sannasa.com

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සහය සංස්කාරක /Asst Editor**
**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
අතුල උපසිරි කල්දෙමුල්ල
Athula Upasiri Kaldemulla

**සේයා රූ/ Photography**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න
Prasanna N Kurukularathne
විජිත කුමාර
Wijitha Kumara

**වෙළඳ දැන්වීම් / Advrertising**
S Jayasinghe
03 8707 4604 / 0402 025 516
sjturaus@optusnet.com.au

**Account Name - Sannasa Media**
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂ්මන් කොඩිතුවක්කු
වි ක ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**

NSW
Lakshman Kodituwakku
Athula Upasiri Kaldemulla

QLD
Ananda Samarathunga
2 Santorini Place
Forrest Lake QLD 4078
07 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhist Vihara

**වැදගත්**

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා / ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දක්වීමට අවසර ඇත

මෙම ස්ථානයේ වෙළඳ දැන්වීම් සඳහා විමසන්න - අසෝක 0432 391 922

